# <u>2027 (1448H) හජ් සමය සඳහා නිල කාලසටහන සහ මෙහෙයුම් වැඩසටහන</u>

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින්, 2027 (1448H) වර්ෂයේ හජ් වන්දනාව සඳහා සහභාගී වීමට අපේක්ෂා කරන වන්දනාකරුවන්, හජ් සංචාරක මෙහෙයුම්කරුවන් (Hajj Tour Operators) සහ අදාළ සියලු පාර්ශ්ව වෙත මෙයින් දැනුම් දෙනුයේ, සෞදි අරාබි රාජධානියේ හජ් හා උම්රා අමාත්‍යාංශය විසින් 2027 (1448H) හජ් සමය සඳහා අදාළ නිල මෙහෙයුම් කාලසටහන සහ ප්‍රධාන ක්‍රියාපටිපාටි නිකුත් කර ඇති බවයි. එබැවින්, සියලු පාර්ශ්වයන් පහත දක්වා ඇති කාලසීමාවන් දැඩිව අනුගමනය කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමු.

| | |
|---|---|
| **2026 ජුනි 30**<br>(1448H මුහර්රම් 15) | • මක්කා සහ මදීනාහි නවාතැන් පහසුකම් සම්බන්ධයෙන් සඳහා මූලික කැමැත්තන් ඇතුළත් කිරීමේ අදියර ආරම්භ කිරීම. |
| **2026 ජුලි 15**<br>(1448H සෆර් 1) | • Nusuk Masar වේදිකාවේ e-wallet වෙත සෘජු මුදල් ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම.<br>**සටහන: වන්දනාකරුවෙකුගේ හජ් වියදමෙන් ආසන්න වශයෙන් තුනෙන් එකක (1/3) මුදලක් කඳවුරු, සේවා සපයන්නන් සහ අනෙකුත් පහසුකම් වෙන්කරවා ගැනීම සඳහා සෞදි අරාබියට ප්‍රේෂණය කළ යුතුය.** |
| **2026 ජුලි 29**<br>(1448H සෆර් 15) | • පසුගිය හජ් සමයේදී සෞදි සේවා සපයන්නන් සමඟ පූර්ව ගිවිසුම් මගින් වෙන්කර ගත් කඳවුරු රඳවා ගැනීමේ තහවුරු කිරීමේ කාලය ආරම්භ වේ.<br>• ශ්‍රී ලංකා හජ් කටයුතු කාර්යාලය විසින් සම්පූර්ණ පැකේජ ගිවිසුම්කරණය ආරම්භ කිරීම.<br>• Nusuk Masar වේදිකාව ඔස්සේ ගුවන් සේවා සමාගම් සමඟ ගිවිසුම් ලේඛනගත කිරීම සහ වන්දනාකරුවන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා අවශ්‍ය මෙහෙයුම් අයදුම්පත් ඉදිරිපත් කිරීම ආරම්භ කිරීම.<br>• වන්දනාකරුවන්ගේ රට තුළ Nusuk කාඩ්පත් බෙදාහැරීමේ කැමැත්තන් ඇතුළත් කිරීම ආරම්භ කිරීම.<br>• මක්කා සහ මදීනා නවාතැන් සම්බන්ධ කැමැත්තන් ඇතුළත් කිරීමේ අදියර අවසන් කිරීම. |
| **2026 අගෝස්තු 13**<br>(1448H සෆර් 30) | • සෞදි සේවා සපයන්නන් සමඟ පූර්ව ගිවිසුම් මගින් කඳවුරු රඳවා ගැනීමේ තහවුරු කිරීමේ කාලය අවසන් වේ.<br>• නව හජ් සංචාරක ක්‍රියාකරුවන් ඇතුළත් කිරීම සඳහා අවසන් දිනය. |
| **2026 අගෝස්තු 14**<br>(1448H රබීඋල් අව්වල් 1) | • වන්දනාකරුවන් සහ හජ් නියෝජිත මණ්ඩල (Delegation) සාමාජිකයන්ගේ දත්ත Nusuk Masar වේදිකාව වෙත උඩුගත කිරීම ආරම්භ කිරීම.<br>• වෛද්‍ය සේවා සපයන්නන් සහ මාධ්‍ය සේවා සපයන්නන් සමඟ ගිවිසුම්ගත කිරීම ආරම්භ කිරීම.<br>• වන්දනාකරුවන්ගේ ගමනාගමන කැමැත්තන් Nusuk Masar වේදිකාව ඔස්සේ ලියාපදිංචි කිරීම ආරම්භ කිරීම.<br>• 1448H හජ් ව්‍යාපාර සැලැස්ම ඉදිරිපත් කිරීමේ අවසන් දිනය. |

| | |
|---|---|
| **2026 සැප්තැම්බර් 26**<br>(1448H රබීඋස් සානි 15) | • වන්දනාකරුවන්ගේ රට තුළ හජ් ලියාපදිංචිය ප්‍රකාශයට පත් කිරීමේ අවසන් දිනය.<br>• ගුවන් සේවා සමාගම් තෝරාගැනීම සහ ගුවන් ප්‍රවේශ ස්ථාන/කෝටා වෙන් කිරීමේ අවසන් දිනය.<br>• වෛද්‍ය සේවා සහ මාධ්‍ය සේවා සපයන්නන් සමඟ ගිවිසුම්ගත කිරීමේ අවසන් දිනය.<br>• හජ් කාර්යාල සාමාජිකයන්ගේ දත්ත උඩුගත කිරීමේ කටයුතු අවසන් කිරීම. |
| **2026 නොවැම්බර් 8**<br>(1448H ජුමාදා අල්-අව්වල් 28) | • 2027 හජ් සමුළුව හා ප්‍රදර්ශනය අතරතුර හජ් කටයුතු ගිවිසුම අත්සන් කිරීම.<br>• වන්දනාකරුවන්ගේ ගමනාගමන කැමැත්තන් සම්බන්ධ ගිවිසුම් අත්සන් කිරීම. |
| **2026 දෙසැම්බර් 24**<br>(1448H රජබ් 15) | • සම්පූර්ණ පැකේජ ගිවිසුම්ගත කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රේෂණය කිරීමේ කාලසීමාව අවසන් කිරීම සහ Nusuk Masar වේදිකාවේ e-wallet ගිණුම් වෙත මුදල් තැන්පත් කිරීම සම්පූර්ණ කිරීම. |
| **2027 ජනවාරි 23**<br>(1448H ෂඅබාන් 15) | • Nusuk Masar වේදිකාව ඔස්සේ සම්පූර්ණ පැකේජය සඳහා ගිවිසුම්ගත කිරීමේ අවසන් දිනය. |
| **2027 ජනවාරි 28**<br>(1448H ෂඅබාන් 20) | • Nusuk Masar වේදිකාව වෙත වන්දනාකරුවන්ගේ දත්ත උඩුගත කිරීමේ අවසන් දිනය.<br>• හජ් කාර්යාල සාමාජිකයන් සඳහා නියමිත අනිවාර්ය පුහුණු වැඩසටහන් සම්පූර්ණ කර වෘත්තීය සුදුසුකම් සහතිකය ලබාගැනීමේ අවසන් දිනය.<br>• වීසා නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම. |
| **2027 මාර්තු 9**<br>(1448H ෂව්වාල් 1) | • වීසා නිකුත් කිරීමේ අවසන් දිනය.<br>• Nusuk Masar වේදිකාව ඔස්සේ ඖෂධ අනුමැතිය (Medication Clearance) සඳහා වන ඉල්ලීම් භාරගැනීමේ අවසන් දිනය. |
| **2027 අප්‍රේල් 8**<br>(1448H දුල්-කඃදා 1) | • වීසා අවලංගු කිරීම සඳහා වන ඉල්ලීම්, එම අවලංගු කිරීම සඳහා අදාළ සාධාරණ හේතු සහ වීසා අවලංගු කරන ලද වන්දනාකරු සෞදි අරාබියට නොපැමිණෙන බවට වන වගකීම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කිරීමේ අවසන් දිනය.<br>• වන්දනාකරුවන්ගේ පැමිණීම ආරම්භ කිරීම. |
| **2027 අප්‍රේල් 27**<br>(1448H දුල්-කඃදා 20) | • සෞදි සේවා සපයන සමාගම සමඟ කඳවුරු පරීක්ෂණ සංචාර ආරම්භ කිරීම. |

**විශේෂ අවධානය සඳහා:**

පහත සඳහන් කරුණු අතිශයින්ම වැදගත් වන බැවින්, අදාළ සියලු පාර්ශවයන්ගේ කඩිනම් අවධානය හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ:

1. **කඳවුරු රඳවා තබා ගැනීම (Retention of Camps):** 2026 හජ් සමය (1447H) තුළ වෙන්කර ගත් කඳවුරු, 2027 හජ් සමය (1448H) සඳහා භාවිතා කිරීමේ අරමුණින්, සෞදි සේවා සපයන සමාගම සමඟ සම්පූර්ණ පැකේජයක් සඳහා පූර්ව ගිවිසුම්ගත වීම මඟින් රඳවා තබා ගැනීමේ කාලසීමාව 2026 ජූලි 29 දින ආරම්භ වී 2026 අගෝස්තු 13 දිනෙන් අවසන් වේ.

2. **වෛද්‍ය සේවා සපයන්නන් (Medical Service Providers):** අනුමත සෞදි වෛද්‍ය සේවා සපයන්නෙකු සමඟ ගිවිසුම්ගත වීම අනිවාර්ය වේ. අදාළ ගිවිසුම්ගත වීමේ කාලසීමාව 2026 අගෝස්තු 14 දින ආරම්භ වී 2026 සැප්තැම්බර් 26 දිනෙන් අවසන් වේ.

3. **වෛද්‍ය සහතික අවශ්‍යතාව (Medical Certificate Requirement):** සෑම වන්දනාකරුවෙකු සඳහාම වලංගු වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

4. **හදී (Hady) ගිවිසුම:** හදී (Hady) ගිවිසුම සම්පූර්ණ කළ යුත්තේ Nusuk Masar වේදිකාව හරහා පමණි.

**එම්.එස්.එම්. නවාස්**
**අධ්‍යක්ෂ**
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**රියාස් මිහුලාර්**
**සභාපති**
ශ්‍රී ලංකා හජ් සහ උම්රා කමිටුව


**ශ්‍රී ලංකා හජ් සහ උම්රා කමිටුව**
**මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**
අංක 180, ටී.බී.ජායා මාවත, කොළඹ 10
දුරකථන අංක : 011-2667909 / 011-2667901
වෙබ් අඩවිය : www.muslimaffairs.gov.lk